# සංක්‍රමණිකයකුගේ සටහන

## Boat People ලාගේ දුක

පසුගිය දවස් වල නීති විරෝධී ලෙස ඕස්ට්‍රේලියාවට පැමිණෙන්නට උත්සාහ දරපු මිනිස්සු ගැන අපට දුකයි. ඒ මිනිස්සු ගැන මෙහේ ස්ථාවර වෙලා ඉන්න අපේ ඇත්තෝ කියන දේවල් ගැන ඊටත් වඩා දුකයි. කවරෙකු හෝ තමන් උපන් දේශය හැර දමා සැතපුම් දහස් ගණනක් ජීවිතයක් මරණයත් අතර සටනක් කරමින් මහ මුහුදේ යාත්‍රා කර කෙම්බිමක් සොයා යෑම අපට අවතක්සේරු කල හැක්කේ කුමන පදනමකින්ද? මෙරටට පැමිණ අපේ ප්‍රශ්න යම්තාක් දුරට විසඳා ගැනීමෙන් පසු එවැනිම උත්සාහයක් දරන්නන්ට ගැරහීම කොපමණ සදාචාරාත්මකදැයි බිඳක් සිතන්න. මේ සිද්ධිය ගැන කථා කරන බොහෝදෙනෙකුගේ මතය වූයේ ''ලංකාවට මාර සවුත්තුව'' යන්න නොවේද? ඒ නීති විරෝධී සංක්‍රමණය අපද අනුමත කරනවා නොවේ. එහෙත් වත්මන් ශ්‍රී ලංකාව තුළ මිනිසුන් අත්විඳින ආර්ථික, සමාජීක හා දේශපාලනික අත්දැකීම් හා පීඩාවන් නිසා මොන ක්‍රමයකින් එයින් මිදී පලා යාමට පෙළඹීම සාධාරණ බව අපට අද අමතක වී ඇත්තේ ඇයි. බොහෝවිට වත්මනෙහි ඔබ හෝ මා එහි සිටියද අපද ගනු ඇත්තේ කුමන තීරණයක්දැයි මැදිහත්ව සිතා බලන්න. මහත්වරුනි මේ ''මාර සවුත්තු'' මානසිකත්වයෙන් මිදී මානුෂිකත්වයෙන් මේ දෙස බලා ඒ ගැන කථා කරන්න. අද අප කල යුත්තේ අපේ රටේ ජනතාවට මේ ක්‍රමවේදයන් තුළින් මෙරටට පැමිණීමේ නිරර්ථක භාවය ගැන කරුණු අවබෝධ කරදීමේ වැඩපිළිවෙළක් සැකසීමට යොමුවීමයි. ඒ සඳහා රාජ්‍ය නියෝජිතයන්ට බල කිරීමට සංවිධානාත්මක පෙල ගැසෙමු. ඔබත් රටත් අපකීර්තියෙන් ගලවා ගත හැක්කේ එවැන්නකින් පමණි.

## බිහිරි අලි

බිහිරි අලින්ට වීනා වාදනය කිරීමෙන් පලක් නැති වුවත් උන්ගේ ඇස් පෙනෙන බැවිනුත් උන්ට කුඩා හෝ මොලයක් ඇතැයි සිතන බැවිනුත් උන්ට පෙනෙන ලෙස මේ දැන්වීම මෙසේ ලියා එල්ලමි.




## පතිරාජගේ කලාව හා අපේ දේශ ප්‍රේමය

මෙරටට සංක්‍රමනය වී සිටින අපේ ඇත්තන්ට පතී ගේ චිත්‍රය ගැන අමුතුවෙන් හඳුන්වා දිය යුතු නැහැ. යථාර්ථවාදී වම් ඉවුරේ කලාකරුවෙක් විදිහට ඔහුට තිබුණේ ලොකු කීර්තියක්. ඒ විදිහට ඇගයුනු පතී අද බෙදුම්වාදී හිතවතෙක් විදිහට හංවඩු ගහන කොට ඇති වෙන්නේ දුකක්. වෙනස් වෙලා තියෙන්නේ පතීගේ කලාවද අපේ දෘෂ්ඨියද? අවසාන නිගමනයේදී එකක් නම් පැහැදිලියි. ඒ පතීගේ කලාව ගැන බොහෝ දෙනෙකුට තිබී ඇත්තේ අනවබෝධයක් බව. අහස් ගව්ව සිට මතුයම් දවස දක්වා ආ ගමන තුළ සමාජය විනිවිද දකින ඔහුට පුද්ගලයන්ගේ ජාති, කුල, ආගම වැදගත් වුනේ නැහැ. එය සිංහල, දෙමළ වශයෙන් වර්ගීකරණය උනේත් නැහැ. ඔහු යන මගේ ඔහු තවමත් යමින් සිටිනවා. වෙනස් වී ඇත්තේ අපියි. මහ ජාතිය තුළ ඔහුගේ කලාව සැරිසරන තාක් යථාර්ථවාදියෙක් ලෙස අපට පෙනෙන ඔහු සුළු ජාතිය තුළට යනවිට බෙදුම්වාදී හිතවතෙක් වෙනවා. එවිට ඔහු ද්‍රෝහියෙක් වෙනවා. මේ චෝදනා නගන මිනිසුන් ඔහු කියන්නට තනන්නේ කුමක්ද යන්නවත් තේරුම් ගන්නට උත්සාහ දරනවාද? සියළුම දෙමළ ජනයා ත්‍රස්තවාදීන් ලෙස සිතිය හැකිද? සිංහල දුකත්, පීඩනයත්, දෙමළ දුකත්, පීඩනයත් එකම හේතුවකින් උපන්නක් නොවේද? මෙහි හාස්‍යජනක පැත්ත නම් පතීට මෙසේ චෝදනා නගන දේශප්‍රේමී මහත්වරුන්ගේ දේශප්‍රේමයට ඇති කැපවීම හා ත්‍රස්තවාදයට, බෙදුම්වාදයට ඇති විරෝධය තරම පතීගේ චිත්‍රපටය දර්ශනය වූ දිනම පැවැති බෙදුම්වාදයට හා ත්‍රස්ත විරෝධී රැලියට සහභාගි වූ ප්‍රමාණයෙන්ම මැන ගත හැකි වීමයි. සියළුම ත්‍රස්තවාදයට හා බෙදුම්වාදයට අපද විරුද්ධ වූවත් උතුරේ වෙසෙන අහිංසක දෙමළ ජනයාගේ පීඩනයටද අප එකඟ නොවන්නෙමු. මාධ්‍යයෙන් අප නොදකින යමක් අපට දකින්නට සැලැස්වීම ගැන පතීට අපගේ ස්තුතිය.

## අවුරුදු

අවුරුදු ළඟා වෙමින් තිබෙනවා. චාරිත්‍ර වගේම දැන් අවුරුදු වලට අපි දකින උත්සවත් ඒකාකාරී යි වගේ දැනෙන්නේ. මේකෙ වෙනසක් වෙන්න ඕනෙ. ඒ ගැන සංවිධායක මහත්වරු පොඩ්ඩක් හිතන්න.

ඒස මඟම ළඟදි මෙහේට එකතුවෙන් අවුරුදු ඉසව්වක් ගැන ලියන්න හිතුණා. ඒ අවුරුදු කුමාරයා හා කුමාරි තේරීමේ තරග. පුදගලිකව මම නම් ඒ තරග පිළිබඳ මනාපයක් නැහැ. මන්ද ඒ තරගය සම්පූර්ණයෙන්ම රුව පදනම් වුණ තරගයක් නිසා. රුව යනු අපට ස්වභාවිකව ලැබෙන දෙයක්. එය අපේ හැකියාවෙන් හෝ දක්ෂකමෙන් හෝ ලැබෙන දෙයක් නෙවෙයි. සමහරු උපතින්ම රූමත්. සමහරු නැහැ. ඉතින් එවැනි දෙයකට තරගයක් පැවැත්වීම කොලමණ දුරට උචිත ද? හිතල බලන්න මේ තරගයට ඉදිරිපත් වන හැමෝම හිතන්නේ තමන් රූමත් කියා යි. මේවට දරුවන් ඉදිරිපත් කරන දෙමාපියන් හිතන්නේ තමන්ගේ දරුවා හරි රූමත් කියා යි. ඒක සාධාරණ සිතිවිල්ලක්. ඒත් ඒක එහෙම නෙවෙයි කියලා තීන්දුවක් ලැබෙන කොට ඇතිවන්නේ කිසියම් දක්ෂතාවක් උරගා බලා ලැබෙන පරාජයේ දුකට වඩා වේදනාවක් අවමානයක් වගේ දෙයක් නෙවෙයි ද? කෙනෙකු අවලස්සන වීම අවමානයට ලක් කළ යුතු දෙයක් ද? එය මානව දයාව අගයන මිනිසුන් කළ යුතු දෙයක් ද?

අවුරුදු උත්සවයට අවුරුදු කුමාරි තෝරන-ʼනට තරග පවත්වන අය මේ ගැන හිතන්න.

## Donation of Instrument Sets to Faculty of Engineering, Peradeniya



From Right: Prof S.B.S. Abeykoon (Dean Engineering), Gamini Hemachandra (PUAAVic), Dr Manjula Sandirigama (Senior Lecture), Yasodhara Handepangoda (Peradeniya Eng Faculty Alumni Association)

As a result of discussions with the Faculty of Engineering and its Alumni Association, Peradeniya University Alumni Australia Victoria Chapter (PUAAVic) promised to donate 100 sets of drawing instruments to the Faculty, to be used mainly by the needy first year students on the basis of a loan. We donated 75 sets in December 2006/ January 2007 and they are now being used by the students. The photograph below was taken when PUAAVic representative, Mr Gamini Hemachandra (FFac 69-73), donated the 75 sets of instruments to the Dean, Prof S.B.S. Abeykoon.

We are now in the process of collecting funds for the remaining 25 sets of instruments. On behalf of PUAAVic and the Faculty, the Association appeal to all Engineering Alumni in Australia to contribute to this project. It is preferable if you could pay for at least for one set by sending a cheque for the appropriate amount (in A$60 or equivalent amount in other currency) in favour of PUAAVic, to P O Box 750, Glen Waverley, 3150.

The PUAAVic assures that all donations will be used entirely to fund this project.

**QLinkQ වෙතින් ඩයලොග් ග්ලෝබල් දුරකථන කාඩ් පත් දෙකක් ඔබට**

## The Challenge

විවේකයට විනෝදයට මේ අභියෝගය විසඳන්න. A රූපය හා B රූපය බැලූ බැල්මට එක හා සමාන ය. නමුත් A රූපයේ නැති වැරදි 10 ක් B රූපයේ ඇත. හැකි නම් ඒ වැරදි 10 සොයාගන්න. B රූපය මත ඒ වැරදි රවුමකින් ලකුණු කරන්න. එසේ ලකුණු කළ B රූපය කපා අපට එවන්න. නිවැරදි විසඳුම් අතරින් තෝරා ගන්නා දෙදෙනෙකුට **QLinkQ** වෙතින් ග්ලෝබල් ඩයලොග් දුරකථන කාඩ්පත බැගින් හිමි වෙයි. අපේ ලිපිනය The Challenge Sannasa 22 Lorne Street Lalor Vic 3075


සන්නස පෙබරවාරි කළාපය සමහර ප්‍රාන්ත වලට ප්‍රමාද වී ලැබී ඇති බැවින් චැලෙන්ජ් ගියවර රූපයම මෙවරද ඉදිරිපත් කරමු.

*සිතුවම - සුනිල් කුමාර අමරකෝන්*

A



B



නම ..........................................................................

ලිපිනය (ඉංග්‍රීසියෙන් ලියන්න)..........................................................

..........................................................................................